සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

**නම : ............................................ බුද්ධ ධර්මය කාලය : පැය 2යි.**

**සැලකිය යුතුයි:**

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40ක් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) බුදු දහමෙහි සඳහන් වන භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(i) සිව්බඹ විහරණයි. (ii) සිව්වනක් පිරිසයි.
(iii) සිව් සඟරාවතයි. (iv) සතර සතිපට්ඨානයයි.

(2) බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය තමාගේම නුවණින් අවබෝධ කරගත් නිසා
(i) බුද්ධ නම් වන සේක. (ii) සුගත නම් වන සේක.
(iii) සම්මා සම්බුද්ධ නම් වන සේක. (iv) ලෝකවිදූ නම් වන සේක.

(3) බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය ලෙස හඳුන්වනු ලබන 'ධම්ම පදය' අයත් වන්නේ,
(i) දීඝ නිකායට ය. (ii) අංගුත්තර නිකායට ය.
(iii) සංයුක්ත නිකායට ය. (iv) ඛුද්දක නිකායට ය.

(4) කාව්‍යශේඛරය නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ
(i) වෑත්තෑවේ හිමියන් විසින් ය. (ii) වීදාගම මෛත්‍රීය හිමියන් විසින් ය.
(iii) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් ය. (iv) ධර්මසේන හිමියන් විසින් ය.

(5) ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ
(i) අෂ්ටාංග සීලයයි. (ii) දස සීලයයි.
(iii) ආජීව අෂ්ටමක සීලයයි. (iv) පඤ්ච සීලයයි.

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.**

(6) ''සුභද්‍රයෙනි භාග්‍යවතුන් වහන්සේ වෙහෙසට පත් නොකරන්න. උන් වහන්සේ ක්ලාන්තව වැතිර සිටිති. '' යනුවෙන් පැවසුවේ ............................... තෙරුන් වහන්සේ ය. (අනුරුද්ධ, සැරියුත්, ආනන්ද)

(7) බුදුරජාණන් වහන්සේ වයස අවුරුදු ....................................... පිරිනිවන් පා වදාළ සේක.
(තිස් පහේදී, අසූවේදී, අනූවේ දී)

(8) .................................... ගුණය නව අරහාදී බුදුගුණවලට අයත් නොවේ. (අරහං, අකාලික, සුගත)

(9) සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාට අග්‍ර වූ තනතුරු ප්‍රදානය කළේ ................................... පොහෝ දිනකය.
(ඇසළ, දුරුතු, නවම්)

(10) ''අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යන සිල් පදය අටසිල්වල .............................. සිල් පදයයි.
(තෙවන, සිව්වන, හත්වන)

v **පහත A තීරුවේ දැක්වෙන ප්‍රකාශයට ගැළපෙන ප්‍රකාශය B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අංකය A තීරුවේ ඉදිරිපස ඇති වරහන තුළ ලියන්න.**

| A | | B |
|---|---|---|
| (11) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් දිසා ගණන | (   ) | 1. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ හමුවීමෙන් පසුව ය. |
| (12) චණ්ඩාශෝක රජතුමා ධර්මාශෝක බවට පත් වූයේ | (   ) | 2. පහකි. |
| (13) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් අයුරු ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකම් ගණන | (   ) | 3. අස්සජි මහරහතන් වහන්සේ හමුවීමෙන් පසුවය. |
| (14) උපතිස්ස පරිබ්‍රාජකයා සෝවාන් බවට පත්වූයේ | (   ) | 4. හයකි. |
| (15) වචනයෙන් සිදුවන වැරදි ගණන | (   ) | 5. හතරකි. |

v **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති වගන්ති හරි නම් ( 3 ) ලකුණ ද වැරදි නම් ( 8 ) ලකුණ ද වරහන තුළ යොදන්න.**

(16) සාමයෙන් සමගියෙන් හා සහයෝගයෙක් කටයුතු කිරීම සහජීවනයයි. (   )

(17) වේදනා ස්කන්ධය පඤ්චස්කන්ධයට අයත් නොවේ. (   )

(18) චතුරාර්ය සත්‍යයට අනුව දුක ඇතිවීමට හේතුව තෘෂ්ණාවයි. (   )

(19) අරියවංශ ධර්ම දේශනා පැවැත්වීම පැරණි බෞද්ධයින් සිදුකළ ආගමික චාරිත්‍රයක් නොවේ. (   )

(20) උම්මග්ග ජාතක කතාවෙන් බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකට වේ. (   )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

v පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) භාවනාව වැඩීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
(ii) බුද්ධ රත්නයේ ගුණ දෙකක් නම් කරන්න.
(iii) ධම්ම පදය නම් ග්‍රන්ථයෙහි ඇතුළත් ගාථා ගණන සහ වග්ග ගණන සඳහන් කරන්න.
(iv) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් පරිදි භාර්යාව විසින් ස්වාමියාට ඉටුකළ යුතු යුතුකම් දෙකක් ලියන්න.
(v) දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ ආකාර තුනෙන් දෙකක් ලියන්න.
(vi) බුදු දහමට අනුව කර්මය දෙයාකාර වේ. ඒවා නම් කරන්න.
(vii) ''උපාය කුසලතාවෙන් යුතු වෙමු'' යන පාඩමේ සඳහන් වන මහෞෂධ කුමාරයා විසඳූ ප්‍රශ්න දෙක නම් කරන්න.
(viii) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹුවන ආචාරශීලී ගුණාංග දෙකක් ලියන්න.
(ix) ''ගුරු බස සැබෑමය'' යන කවිය සම්පූර්ණ කර ලියන්න.
(x) ''උච්චාසයන මහා සයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යන සිල්පදයෙහි තේරුම ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(2) (i) සීලය යනු කුමක් දැයි කෙටියෙන් ලියන්න. (ලකුණු 2)
(ii) පන්සිල් පදවලින් පළමු සිල්පද තුන පිළිවෙළින් ලියන්න. (ලකුණු 3)
(iii) ''පන්සිල් සුරැකීමෙන් යහපත් සමාජයක් ගොඩනගා ගත හැකිය.'' මෙය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(3) (i) චතුරාර්ය සත්‍යයෙහි පළමු ආර්ය සත්‍යය නම් කරන්න. (ලකුණු 2)
(ii) තණ්හාව තුන් ආකාර වේ. ඒවා නම් කරන්න. (ලකුණු 3)
(iii) තණ්හාව නිසා පුද්ගලයාගේ මෙලොව ජීවිතය පරිහානියට පත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(4) (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි '' යන පාලි පාඨයෙහි අදහස ලියන්න. (ලකුණු 2)
(ii) කයින් සිදුවන අකුසල කර්ම තුන නම් කරන්න. (ලකුණු 3)
(iii) පුද්ගලයාගේ මෙලොව ජීවිතය සාර්ථක කරගැනීම සඳහා කර්මය ඉවහල් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(5) (i) ''යස්ස පාපං කතං කම්මං'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 2)
(ii) එහි අදහස ලියන්න. (ලකුණු 3)
(iii) මෙම ගාථාව ඇසුරින් ඔබගේ ජීවිතය ආලෝකමත් කරගැනීමට ලබාගත හැකි ආදර්ශ පාඨ පහක් ලියන්න. (ලකුණු 5)

(6) (i) සිරිත් හා විරිත් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ii) අප අතර ක්‍රියාත්මක වන බෞද්ධ මුහුණුවරක් ගන්නා චාරිත්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 3)
(iii) බෞද්ධ දරුවකු වශයෙන් ඔබගේ උපන්දින උත්සවය සැමරිය යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(7) (i) ධර්ම රත්නය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
(ii) ධර්ම රත්නයේ ගුණ හය නම් කරන්න. (ලකුණු 3)
(iii) බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මයට සවන්දීම තුළින් ඔබගේ ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

### බුද්ධ ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - (ii) (2) - (iii) (3) - (iv) (4) - (iii) (5) - (iv) (6) ආනන්ද (7) අසූ වියේදී

(8) අකාලික (9) නවම් (10) තෙවන (11) 4 (12) 1 (13) 2 (14) 3 (15) 5

(16) ( 4 ) (17) ( 8 ) (18) ( 4 ) (19) ( 8 ) (20) ( 4 ) (ලකුණු 2 x 20 = 40 )

## II කොටස

(1) (i)
- ධාරණ ශක්තිය වැඩිවීම.
- පොතපත පාඩම් කිරීමේදී වෙනදාට වඩා පහසුවක් දැනීම.
- කායික රෝග පීඩා අඩුවීම.
- සිත එකඟ කරගැනීමට හැකිවීම.
- ප්‍රසන්න පෙනුමක් ඇතිවීම (ලකුණු 2)

(ii)
- අරහං
- සම්මා සම්බුද්ධ
- විජ්ජාචරණ සම්පන්න
- සුගත
- ලෝකවිදූ
- අනුත්තරෝ පුරිසදම්ම සාරථී
- සත්ථා දේව මනුස්සානං
- බුද්ධ
- භගවා (ලකුණු 2)

(iii) ගාථා 423, වග්ග 26 (ලකුණු 2)

(iv)
- ගෙදරදොර කටයුතු සංවිධානය කිරීම.
- ස්වාමියාගේ ඥාති මිත්‍ර සේවකාදීන්ට මැනවින් සැලකීම.
- වෙනත් පුරුෂයන් නොපැතීම.
- උපයාගත් ධනය ආරක්ෂා කිරීම.
- දක්ෂව අනලස්ව සියලු කටයුතු කිරීම.

(ලකුණු 2)

(v)
- දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක)
- විපරිනාම දුක්ඛතා (වෙනස්වීම පිළිබඳ දුක)
- සංඛාර දුක්ඛතා (සංස්කාර පිළිබඳ දුක)

(ලකුණු 2)

(vi) අකුසල කර්ම (පාප කර්ම)
කුසල කර්ම (පුණ්‍ය කර්ම) (ලකුණු 2)

(vii) දණ්ඩක ප්‍රශ්නය
වැලියොත් ප්‍රශ්නය (ලකුණු 2)

(viii)
- සුහදශීලී කතාබහ.
- ආගන්තුක සත්කාරය.
- මහජන මතයට ගරු කිරීම.
- අල්ප ශබ්දතාව.
- නිහතමානී බව. (ලකුණු 2)

(ix) ගුරු බස සැබෑම ය
එය පිළිගැනුම යුතුම ය
පඬි බසත් එය මය
එයින් දෙලොවෙහි මහත් සැපමය
(ලකුණු 2)

(x) මම උසසුන් මහසුන් පරිභෝගයෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි.
(ලකුණු 2)

(2) (i) කය සහ වචනය සංවර කරගැනීම.
(ලකුණු 2)

(ii)
- පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
- අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
- කාමේසුමිච්චාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි (ලකුණු 3)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(3) (i) දුක්ඛ ආර්ය සත්‍යය (ලකුණු 2)

(ii) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා
(ලකුණු 3)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(4) (i) ''මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි.'' (ලකුණු 2)

(ii) සතුන් මැරීම
සොරකම් කිරීම
කාමයෙහි වරදවා හැසිරීම.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(5) (i) යස්ස පාපං කතං කම්මං
කුසලේන පිථීයතී
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා (ලකුණු 2)

(ii) යමකු විසින් කරන ලද පාප කර්මය
ඔහු විසින්ම කරන ලද කුසල කර්මයෙන්
වැසී යයි ද ඒ තැනැත්තා වලා ගැබෙන්
මිදුණ පුන් සඳ මෙන් ලෝකය බබළවයි.
(ලකුණු 3)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(6) (i) සිරිත් යනු කළ යුතු දේවල් ය.
විරිත් යනු නොකළ යුතු දේවල් ය.
(ලකුණු 2)

(ii) අකුරු කියවීම, උපන් දින උත්සව, ගෘහ ප්‍රවේශ මංගල්‍යය, සරණ මංගල්‍යය, පිරිත් පින්කම්, දානමය පින්කම්, අවමංගල්‍ය චාරිත්‍ර
(ලකුණු 3)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)

(7) (i) අවුරුදු හතළිස් පහක් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය (ලකුණු 2)

(ii) ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ
ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං
වේදිතබ්බෝ විඤ්ඤූහි (ලකුණු 3)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)